0062

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන
6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2025/2026
SNU6227/SNU6221/ESU4121- අන්තර්කරණ ප්‍රාථමික අධ්‍යාපනය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2026.06.26 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලට ද, 2 වන කොටසේ තෝරා ගන්නා ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 01- කොටස

01. ප්‍රාථමික අධ්‍යාපනයයේ "ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය" පිළිබඳ සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.
02. "අන්තර්කරණ අධ්‍යාපනය" යන යෙදුමෙන් අදහස් කරන්නනෝ කුමක්ද?
03. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකුට පන්ති කාමරය තුළ පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
04. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් අතර සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන නිපුණතා හතරක් (04) ලැයිස්තුගත කරන්න.
05. 3 ශ්‍රේණියේ සිසුවකු විසින් පහත ගණිතමය ගැටළුව සම්පූර්ණ කරන ලදී.

    62+82 = 46, 54+71=26, 90+56=47, 82+95=78

    එකතු කිරීමේදී ශිෂ්‍යයා විසින් කරන ලද දෝෂය හඳුනා ගන්න. හඳුනාගත් දෝෂය නිවැරදි කිරීම සඳහා සුදුසු ඉගැන්වීම් උපාය මාර්ග යෝජනා කරන්න.
06. ප්‍රාථමික අධ්‍යාපනයේ තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.
07. 1997 න් පසුව ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයට හඳුන්වා දුන් ප්‍රධාන ප්‍රතිසංස්කරණ දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.
08. "ක්‍රියාවෙන් ඉගෙනුම" ප්‍රාථමික අධ්‍යාපනයේ වැදගත් මූලධර්මයකි. සුදුසු උදාහරණ සමඟ මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x08=40)

**02- කොටස**

09. (i.) පන්ති කාමර තක්සේරු කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 05)
(ii.) ප්‍රාථමික ශ්‍රේණිවල භාවිත වන විවිධ තක්සේරු ක්‍රම පැහැදිලි කරන්න. (ලකුණු 07)
(iii.) ප්‍රාථමික අධ්‍යාපනයේ අඛණ්ඩ තක්සේරු කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 08)

10. (i.) ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රාථමික අධ්‍යාපනය මුහුණ දෙන ප්‍රධාන අභියෝග ලැයිස්තු ගත කරන්න. (ලකුණු 08)
(ii.) ග්‍රාමීය පාසල්වල ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ පාසල් පැමිණීම සහ සහභාගිත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 12)

11. (i.) දෙවන ප්‍රධාන අවධියේ ප්‍රාථමික වසරවල දරුවන්ගේ සංවර්ධන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06)
(ii.) ඉහත සඳහන් කළ ඕනෑම සංවර්ධන ලක්ෂණ තුනක් (03) මත පදනම්ව නිපුණතා සංවර්ධනයට සහායවීම සඳහා ගුරුවරයකුට පන්ති කාමර ක්‍රියාකාරකම් සංවිධානය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 14)

12. (i.) ප්‍රාථමික අධ්‍යාපනයේ අරමුණු තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)
(ii.) පහත අංශ කෙරෙහි මාරියා මොන්ටිසෝරි අධ්‍යාපන දර්ශනයේ බලපෑම පැහැදිලි කරන්න.

- ප්‍රාථමික පන්තිකාමරයේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම
- ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාව
- පන්ති කාමර පරිසරය (ලකුණු 14)

13. "ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය බොහෝ දුරට ගුරුවරුන්ගේ නිපුණතා මත රඳා පවතී."

(i.) මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)
(ii.) ප්‍රාථමික පාසල් ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර ඇති වෘත්තීය වැඩසටහන් දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 10)

14. (i.) ප්‍රාථමික පාසල් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ඕනෑම ශ්‍රේණියකින් තේමාවක් තෝරාගන්න. (ලකුණු 04)
(ii.) තෝරාගත් තේමාව මත පදනම්ව කෙටි පාඩම් සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 10)
(iii.) ඉහත සකස්කළ පාඩම් සැලැස්මට අනුව සිසුන්ගේ ඉගෙනීම තක්සේරු කිරීම සඳහා සුදුසු නිර්ණායක සහිත තක්සේරු පත්‍රයක් (rubric - රූබ්‍රික් ) හෝ පිරික්සුම් ලැයිස්තුවක් සකස් කරන්න. (ලකුණු 06)

-සියලුම හිමිකම් ඇවිරිණි.-